**මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ - ග්‍රාමීය මාර්ග නියමු සංරචකය - 2014**

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ - ග්‍රාමීය මාර්ග නියමු සංරචකය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය(ජාසංසං) අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138 සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ සංවර්ධන ණය ගිවිසුමට අනුව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ පහත දැක්වෙන කරුණු ඇතුළත්ව පළාත් සභා සඳහා කොන්ත්‍රාත් තුනක් හා ප්‍රාදේශීය සභා සඳහා කොන්ත්‍රාත් නවයක නියමු වැඩසටහනක් කර ගෙන යාමයි.

(අ) ප්‍රාදේශීය සභාවල ග්‍රාමීය මාර්ග කළමනාකරණය හා නඩත්තු ක්‍රම ශක්තිමත් කිරීම,

(ආ) ග්‍රාමීය මාර්ග ප්‍රවේශකත්වය වැඩි දියුණු කිරීම සඳහා ආසන්න වශයෙන් කිලෝ මීටර් 160 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම,

(ඇ) ග්‍රාමීය මාර්ග කළමනාකරණය හා ප්‍රාදේශීය සභා විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතිවල නඩත්තු පද්ධතිය හා කොන්ත්‍රාත් කළමනාකරණය හා ඉදිකිරීම් අධීක්ෂණය ශක්තිමත් කිරීම ඇතුළත් කාර්මික සහය ලබාදීම,

(ඈ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ කාර්යමණ්ඩල හා පළාත් සභා හා ප්‍රාදේශීය සභා ව්‍යාපෘති කාර්යය මණ්ඩලය, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකවරුන් සඳහා ධාරිතා වර්ධනය ඇතුළත් පුහුණු හා ආයතනික සංවර්ධනය,

(ඉ) ව්‍යාපෘතියේ ‘‘බී’’ කොටස සඳහා ස්වාධීන කාර්මික විගණනයක් සිදු කිරීම සහ

(ඊ) ව්‍යාපෘතියේ ‘‘බී’’ කොටස සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා උපකරණ ලබා දීම.

ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,657 කට සමාන එ.ජ.ඩො. මිලියන 14.61 ක් වන අතර, ඉන් රු. මිලියන 1,632 කට සමාන එ.ජ.ඩො. මිලියන 14.40 ක් මූල්‍යනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. 2006 මැයි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කළ අතර, 2011 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 සැප්තැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනසේ කළමනාකරණය තීරණය කරන එවැනි අත්‍යවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ඇතිකිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද කාර්යයසාධන වාර්තා සහ මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා

ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඌ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(එ). සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඉ) සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට තථ්‍ය අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සංවර්ධන ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංස | 14.40 | 1,632 | 0.08 | 10.05 | 0.08 | 10.50 | 14.40 | 1,632.50 |
| ශ්‍රීලංර | 0.21 | 25 | - | 0.50 | - | 0.37 | 0.17 | 19.50 |
| එකතුව | 14.61 | 1,657 | 0.08 | 10.55 | 0.08 | 10.87 | 14.57 | 1,652.00 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු වලට අනුව, ඌව පළාත, උතුරු මැද පළාත හා දකුණු පළාත්වල පිළිවෙලින් කිලෝමීටර් 69, කිලෝමීටර් 46 හා කිලෝමීටර් 46.4 ක දිගින් යුත් ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කාර්යය ව්‍යාපෘතිය විසින් 2011 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. 2014 සැප්තැම්බර් 30 දක්වා වූ පසු කාලපරිච්ඡේදය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් නොමැතිව ව්‍යාපෘතියේ මෙහෙයුම් පවත්වාගෙන ගොස් තිබුණි. පළාත් සභා හා ප්‍රදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ට අනුව පසු කාලපරිච්ඡේදය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකළ අතර ඒ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් නොකරන ලදී.

(ආ) ලැබුණු තොරතුරු වලට අනුව, 2011 දෙසැම්බර් වන විට සම්පූර්ණ කරන ලද දකුණු පළාතේ මිල්ලව තොලබෝවිල මාර්ගය, වැවගම - කුඩා ඉදිවැව මාවත මාර්ගය සහ

ජනාධිපති මාවත විෂය පථය පිළිවෙලින් සියයට 90.2, සියයට 62.88 සහ 49.42 කින් විචලනයන්ගේ වටිනාකම ඉක්මවා තිබුණි. කෙසේ වුවද, එවැනි විචලනයන්ට හේතු සහ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ආදිය විගණනයට ලැබී නොතිබුණි. පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ පැහැදිලි කිරීම් අනුව, එම කරුණු සඳහා දකුණු පළාත් සභාවේ අනුමැතිය 2012 සැප්තැම්බර් 20 දින ලැබී තිබුණි.

(ඇ) ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීමේ අත්පොත් පිළියෙල කර පළාත් සභා අතර බෙදා දී තිබුණද, ව්‍යාපෘතිය විසින් අත්පොත් හි යෝජනා කර ඇති ආකාරයට මාර්ග නඩත්තු කිරීමේ ක්‍රියාපරිපාටියක් ක්‍රියාත්මක කිරීමට සහ ඒ අනුව පසු විපරම් ක්‍රියාමාර්ගයක් ගැනීමට යෝග්‍ය යාන්ත්‍රණයක් පිහිටුවා නොතිබුණි.

**3.3 නිරාර්ථක ගනුදෙනු**

---------------------

2014 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කර තිබුණද, ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර නිලධාරීන් 42 ක් සහ රේඛීය අමාත්‍යාංශයේ අනිකුත් නිලධාරීන් 2014 සැප්තැම්බර් 23 දින හම්බන්තොට දක්වා ගුවනින් ගමන් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු. 479,250 ක් වැයකර තිබුණි. හම්බන්තොට දක්වා ගුවනින් ගමන් කිරීමේ අරමුණ විගණනයට විධිමත් ලෙස පැහැදිලි නොකෙරිණි.

**3.4 ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කිරීම**

-------------------------------------

ව්‍යාපෘතියේ කාර්යයන් 2014 සැප්තැම්බර් 30 දින අවසන් විය. ග්‍රාමීය මාර්ග නියමු සංරචකයෙහි ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව 2015 මාර්තු 31 දින වන විටද ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වෙත පිළියෙල කර භාරදී නොතිබුණි.